# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2012 නොවැම්බර් මස 09 වන දින

## II වන කොටස

## අතිරේකය

(2012.11.12 දින නිකුත් කරන ලදී)

## නාවික හමුදා (සංශෝධන)

**නාවික හමුදා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 3.00 යි.     තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඇති අතුරු විධානය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වන්නේ නාවික නීතියට යටත්වීම අවසන් වන ලද පුද්ගලයන් සම්බන්ධයෙන් මෙම පනත යටතේ වූ වැරදි සඳහා නඩු විභාග කරනු ලැබිය හැකි කාලසීමාව අවුරුදු දෙකේ සිට මාස හයක් දක්වා අඩු කිරීම වේ.

## නාවික හමුදා (සංශෝධන)

එල්.ඩී.—ඕ. 26/2012.

**නාවික හමුදා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2012 අංක    දරන නාවික හමුදා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

358 වන පරිච්ඡේදයේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. 1993 අංක 11 දරන පනතින් සංශෝධිත නාවික හමුදා පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඇති අතුරු විධානයේ "එම වරද සොයා ගැනීමේ දිනයෙන් පසුව අවුරුදු දෙකක කාලයක් ගතවීමෙන් පසුව" යන වචන වෙනුවට "එම වරද සිදු කිරීමේ දිනයෙන් පසු මාස හයක කාලයක් ගතවීමෙන් පසුව" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.